ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SPLG/MT/A/MaliPS/05/2023/29

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 17 දින

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති කාර්යාලය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
ගාල්ල.

සහ ලේකම්,
මාලිමබඩ ප්‍රාදේශීය සභාව.

මාලිමබඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යළෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එම්.කී. මදරසිංහ,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

එම්.කී. මදරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
දකුණ පළාත විගණන කාර්යාලය
මාතර

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන කොමසාරිස් කාර්යාල

ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිවයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු සහික ඉන්ධන දීමනාව රු. 7,600 ක් වුවද එය රු. 76,000 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් විවිධ ණය හිමි ශේෂය රු. 68,400 කින් වැඩිපුර ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත 07 කට අදාලව රු. 2,931,141 ක් ලෙස ප්‍රාග්ධන ණයහිමි ශේෂ ගිණුම්ගත කළ යුතු වුවද එය රු. 5,489,514 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ප්‍රාග්ධන ණයහිමි ශේෂය රු. 2,558,373 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සහාව සතු ගොඩනැගිලි 2 ක් සංවර්ධනය සඳහා දරන ලද රු. 1,540,117 ක වියදම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 38,781,982 ක් වුවද එය රු. 40,516,304 ක් ගිණුම්ගත කිරීමෙන් රු. 1,734,322 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු. 622,251 ක් වුවද, එය රු. 415,120 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු. 207,131 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) රු. 185,000 ක වටිනාකමින් යුත් සහාව සතු බොකටුගහහේන ජන උදාන ගම්මානය ප්‍රජා ශාලාවෙහි වටිනාකම ඉඩම හා ගොඩනැගිලි යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(උ) අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 94,146 ක් වූ ගිණුම් විෂයන් 6 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛණ/උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු. 106,941,520 ක වෙනසක් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිවයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ

සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 අනුකූල නොවීම

1.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති, රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මු.රෙ. 104(3) හා 104(4)	2018 හා 2019 වර්ෂවලදී සිදුවූ වාහන අනතුරු 3 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද 2021 වර්ෂයේදී සභාව සතු කැබ රථයකට සිදුවී ඇති අනතුරට අදාළ අවසන් වාර්තාවද ඉදිරිපත් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබූ අතර එම වාහන අනතුරු සිදුවී සමාලෝචිත වර්ෂය අවසානය වන විට වසර 05 ක් හා වසර 02 ක කාලසීමාවක් ගතවී තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.
SPLG/MT/A/MaliPS/ 05/2023/29

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2024 මැයි 17 දින

සභා ලේකම්
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල්

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2023				2022			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල් කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල් කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	චරිපනම් හා බදු	4,335,700	1,994,663	1,909,010	218,547	3,935,700	262,074	304,902	132,894
(ii)	කුලී	9,147,500	3,173,969	3,097,857	304,513	7,647,500	2,883,350	3,481,238	228,401
(iii)	බලපත්‍ර ගාස්තු	1,363,000	980,675	1,108,875	-	907,000	1,239,140	1,337,940	128,200
(iv)	වෙනත් අදායම්	7,764,300	11,300,079	11,304,599	195,912	4,626,400	4,223,865	4,518,905	200,432
		22,610,500	17,449,386	17,420,341	718,972	17,116,600	8,608,429	9,642,985	689,927

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය.

සමාලෝචිත වර්ෂය තුල ඇස්තමේන්තුගත ආදායම රු. 22,610,500 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු. 689,927 ක හිඟ මුදල හා බිල් කිරීම් රු. 17,449,386 ක් සමඟ රු. 18,139,313ක් අයවීමට තිබූ අතර වර්ෂය තුලදී මුළු අයවීම් රු. 17,420,341 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු. 718,972 ක් විය.

2.2.3 වරිපනම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් ශේෂය රු. 123,484 ක් වූ අතර වරිපනම් ඒකක 421 කට අදාලව වර්ෂය තුලදී බිල් කිරීම් රු. 249,260 ක් සමඟ රු. 372,744 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු. 304,900 ක් වීම නිසා වර්ෂය අවසානයට වරිපනම් ඒකක 68 කට අදාලව රු. 67,844 ක හිඟ ශේෂයක් පැවතුණි. ඉන් රු. 32,383 ක් වූ ශේෂය වර්ෂ 2 කට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට රු. 1,000 ට වැඩි හිඟ වරිපනම් ඒකක සංඛ්‍යාව 20 ක් වූ අතර ඉන් වාණිජ ඒකක 9 ක් හා වාණිජ නොවන ඒකක 11 ක් පැවතුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වන වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ග්‍රාම නිලධාරී කොට්ඨාස 17 කට අයත් වර්ග කිලෝමීටර් 30 ක පමණ ප්‍රමාණයක් හඳුනාගෙන තිබූ අතර 2022 සැප්තැම්බර් 30 දිනැති අංක 2300 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර තිබුණි. වරිපනම් බදු අය කිරීම සඳහා දේපළ 600 ක් පමණ හඳුනාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කර වසරකට අධික කාලයක් ගතවී තිබුණද තක්සේරු ප්‍රමාදවීම හේතුවෙන් වරිපනම් බදු අය කර ගැනීමට නොහැකිවී තිබුණි.

2.2.4 කුලී.

පහත දක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ කුලී ශේෂය රු. 223,824 ක් වූ අතර වර්ෂයේ බිල්කිරීම් රු. 3,010,174 ක්ද ඇතුලත්ව රු. 3,233,824 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී අයවීම් රු. 2,929,312 ක් වීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු. 304,512 ක් අයවිය යුතුව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව සතු වෙළෙඳ සංකීර්ණ 2 හි කඩ කාමර 43 න් කඩ කාමර 42 ක් බදුදී තිබූ අතර ඉන් කඩ කාමර 18 කින් රු. 267,830 ක හිඟ ආදායමක් අයවිය යුතුව පැවතුණි. ඉන් රු. 34,125 ක ශේෂයක් අවුරුදු 2 කට අධික කාලයක සිට අයවිය යුතුව පැවතුණි.

(ඇ) මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු කඩ සංකීර්ණයේ කඩ කාමර 14 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා තිබූ බව නිරීක්ෂණය විය. කඩ සංකීර්ණයේ ඉහළ මහලට ප්‍රවිෂ්ඨ වීමට එක් පඩිපෙළක් පැවතීමත් එම කඩ කාමර ප්‍රධාන මාර්ගයෙන් ආවරණය වී පවතින බැවින් ගනුදෙනුකරුවන් නොපැමිණීමත් නිසා වසා දමා ඇති බව නිරීක්ෂණය විය. එම කඩ කාමර අතුරින් කඩ කාමර 07 කින් රු.133,235 ක හිඟ කුලී මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතුව පැවතුණි.

(ඈ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 11 ඡේදයේ විධිවිධාන වලින් බැහැරව සභාව සතු කඩ සංකීර්ණයේ කඩ කාමර 03 ක් වෙනත් පාර්ශවයන් වෙත අතුරු බදුදී ඇති බව 2023 නොවැම්බර් 17 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට පොළ හා මස් කඩ බදු දීම තුලින් අයවිය යුතුව පැවති ශේෂය රු. 36,683 ක් වූ අතර එම ශේෂය වසර 5 කට අධික කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි.

2.2.5 වෙනත් ආදායම්

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 127,725 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු මුදලක් අයවිය යුතුව පැවති අතර එම ශේෂය වසර 5 කට අධික කාලයක් තිස්සේ හිඟව පැවතුණි.

(ii) මුදල් රෙගුලාසි 371 (5) සමාලෝචිත වර්ෂය තුලදී නිලධාරියෙකු විසින් ඉඩම් මැනුම් කටයුතු සඳහා ලබාගෙන තිබූ රු. 5,000 ක අත්තිකාරම් එම කාර්යය අවසාන වී තිබුණද විගණන දිනය වූ 2024 මාර්තු 13 දින වන විටත් අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු. 15,269,110 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු. 8,459,120 ක් විය.

(ඇ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 2016 සිට 2020 දක්වා කාලපරිච්ඡේදය තුළ ගොඩනැඟිලි අයදුම්පත් 576 ක් අනුමත කර තිබූ අතර ගොඩනැඟිලි සංවර්ධන බලපත්‍ර ලබා දී වසර 03 ත් වසර 07 ත් අතර කාලයක් ගතවී තිබූ නමුත් ගොඩනැඟිලි 12 කට පමණක් අනුකූලතා සහතික ලබාගෙන තිබූ අතර එය අනුමත කළ ගොඩනැඟිලි අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 2 ක් විය.

(ඉ) ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම 29 කින් ග්‍රාම නිලධාරී වසම 05 ක මාර්ග හඳුනාගෙන මැනුම් කටයුතු අවසන් කර තිබුණ අතර එම මාර්ග සිතියම්ගත කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අවසන් කර නොතිබුණි.

(ඊ) 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දින ගැසට් නිවේදනයේ 28(1) වගන්තියේ විධිවිධානවලින් බැහැරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ හෝ ඉදිකරමින් පැවති ගොඩනැඟිලි 08 ක් සඳහා එලෙස සංවර්ධන බලපත්‍ර ලබාගෙන නොතිබුණි. ඉන් ගොඩනැඟිලි 6 ක් ඉදිකිරීමේදී ගොඩනැඟිලි සීමාවන් හා නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසිවලට අනුකූලව ඉදිකිරීම් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට අයකළ යුතු දඩ, අධි ගාස්තු හා ප්‍රමාද ගාස්තු රු. 8,080 ක් වූ අතර වර්ෂයට අදාලව අයකල යුතු රු. 65,835 ක්ද සමඟ සමාලෝචිත වර්ෂය තුලදී රු. 73,915 ක් අයවිය යුතුව පැවතුණි. වර්ෂය තුලදී රු. 40,419 ක් අයවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් රු. 33,496 ක් අයවිය යුතුව පැවතුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 415,120 ක් හා මුද්දර ගාස්තු රු. 40,516,304 විය.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අක්කර 01 රූඩ් 01 පර්චස් 31.80 කින් යුත් ඉඩමට පනවා තිබූ කොන්දේසි අනුව ඉඩම සංවර්ධනය කර අනුකූලතා සහතික ලබා ගැනීමෙන් තොරව ඉඩම් කැබලි 18 න් 13 ක් විකුණා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර 01 පර්චස් 36 කින් යුක්ත එක්තරා ඉඩමක් කැබලි කර විකිණීමේදී මාර්ග නියමිත ප්‍රමිතීන්ට සකස් කළ බවට වරලත් ඉංජිනේරු වරුන්ගේ වාර්තාවක් ලබාගෙන තිබුණද, ඉඩමේ අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගයේ ආරම්භයේ සිට මීටර් 24.5 ත් 27.5 ත් අතර කොටසේ තාර ඇතිරුම ගිලා බැස තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රූඩ් 01 පර්චස් 37 ක ප්‍රමාණයකින් යුත් ඉඩම කැබලි කර නේවාසික භාවිතය සඳහා කොන්දේසි රහිතව 2022 ජුනි 09 දිනැති අංක 209 දරන සැලසුම් කමිටු තීරණය කර තිබූ අතර අනුකූලතා සහතිකය ලබා දීමෙන් තොරව ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කරමින් ඉඩම විකිණීමේ කටයුතු ආරම්භ කර තිබුණි. නාගරික සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුලත්ව 2021 ජූලි 08 අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ II වන කොටසේ 27(1) 27(3) විධිවලින් බැහැරව කටයුතු කිරීමක් බව නිරීක්ෂණය විය.

(අ) යන අපද්‍රව්‍ය කළමනාකරණය

මෙ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවෙදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අළෙවි කළ නොහැකි මට්ටමේ පවතින නොදිරන කසළ බැහැර කිරීම සඳහා සභාව විසින් විධිමත් වැඩ පිළිවෙලක් අනුගමනය නොකරන අතර එක්රැස්වන අළෙවි කළ නොහැකි නොදිරන කසළ කොම්පෝස්ට් භූමියෙහිම පස් දමා වසා දමන බව විගණනයට නිරීක්ෂණය විය.

(ii) 2013 වර්ෂයේදී සුල්තානාගොඩ කැකිල්ල ප්‍රදේශයේ රුඩ් 03 ක භූමිය තුළ සභාව විසින් කසළ කළමනාකරණ ව්‍යාපෘතිය ආරම්භ කර තිබූ අතර වසර 11 කට ආසන්න කාලයක් ගත වී තිබුණද මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතු වුවද සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1642 ප්‍රකාරව ප්‍රාදේශීය සභාව සතු වාහන 02 කට 2018 සිට 2022 දක්වා කාල පරිච්ඡේදය තුල සිදුවූ වාහන අනතුරු 05 ක් සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2007 ජුනි 16 දිනැති අංක 2007:01 දරන ප්‍රධාන ලේකම්ගේ වක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව සභාවේ සේවයේ නියුතු නිලධාරීන් 10 දෙනෙකු සමාලෝචිත වර්ෂය සඳහා නියමිත පරිදි ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කර නොතිබුණු අතර උක්ත වක්‍රලේඛයේ 05 වන ඡේදය ප්‍රකාරව සභාවේ සේවය කරන නිලධාරීන් 09 දෙනෙකු නියමිත පරිදි පසු වැඩසටහන්ද ඉදිරිපත් කර නොතිබුණි. තවද ඉටු කළ වැඩ සාරාංශ ඉදිරිපත් කිරීමේදී තමන් විසින් ඉටු කළ වැඩ කොටස් ඉතා පැහැදිලිවන සටහන් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි.

3.4 මත භේදයට තුඩුදුන් ගණුදෙණු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් කළමනාකරණ සේවා නිලධාරින්ගේ සංගමය විසින් වාර්ෂිකව පවත්වනු ලබන සම්මේලනය සඳහා සභාවේ නිලධාරින්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් පසුගිය හා සමාලෝචිත වර්ෂයන්හිදී රු. 100,100 ක් බාහිර පාර්ශවයක් වෙත ගෙවා තිබුණි. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන මගින් මෙවැනි ගෙවීම් සඳහා කිසිදු නෛතික ප්‍රතිපාදනයක් සලසා නොතිබියදීත් මේ ආකාරයෙන් වෘත්තීය සමිති සම්මේලන සඳහා නිලධාරින්ට සහභාගිවීමට ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා පෞද්ගලික පාර්ශවයන් වෙත සහා අරමුදලින් ගෙවීම් කිරීම නෛතික ගෙවීමක් නොවන බව නිරීක්ෂණය කෙරේ.

(ආ) 2018 මාර්තු 09 සිට 2023 මාර්තු 09 දක්වා සම්මත කරන ලද ප්‍රාදේශීය සභා සභිකයන්ගේ ධුර කාලය 2023 මාර්තු 19 දක්වා දීර්ඝ කළ අතර 2023 මාර්තු 19 දිනෙන් සභාව නිල කාලය අවසන් වුවද 2023 මාර්තු මාසය වෙනුවෙන් සභික දීමනා අනුපාතිකව ගෙවීම් කළ යුතු වුවද එසේ සිදු නොකිරීම සභිකයින් 09 දෙනෙකු වෙත රු. 52,254 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.5 වත්කම් කළමණාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 1996 වර්ෂයේදී යුධ හමුදාමට භාරදී 2010 වර්ෂයේදී නැවත සභාවට භාරදී තිබූ සභාව සතු අංක 53-5706 දරන කැබ් රථය අපහරණය කිරීම සඳහා 2019 ජනවාරි 30 දින නිර්දේශ කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපහරණ කටයුතු අවසන් කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ii) 2015 පෙබරවාරි 06 දින රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් සභාවට ලැබී තිබූ අංක YTS-6308 දරන ගල්රෝල භාවිතයට නොගෙන 2017 පෙබරවාරි 17 දින සිට තෙලිජ්ජවිල පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිලි පරිශ්‍රයේ විගණන දිනය වූ 2024 මාර්තු 13 දින වන තෙක් ගාල් කර තිබුණි. මෙම ගල් රෝල භාවිතයට නොගන්නේ එම කාල පරිච්ඡේදයේම විකල්ප ක්‍රියාමාර්ගයක් වගකිවයුතු නිලධාරීන් නොකිරීම නිසා සහා දේපලක් නිෂ්කාර්ය හා අනාරක්ෂිතව තිබීමෙන් අබලන් තත්ත්වයට පත්වී තිබුණි.

3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම.

2017 මාර්තු 19 දිනැති අංක දපස/15 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලිපිය ප්‍රකාරව පළාත් පාලන ආයතන සතු සෑම දේපලකටම වැට මායිම් දමා අනවසරයෙන් ඇතුළු වීමට නොහැකි වන සේ පවත්වා ගෙන යාමට සහ ගැටළු සහගත තත්ත්වයේ ඇති ඉඩම් මැන නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වුවද සභාව සත අක්කර 8 ක පමණ ඉඩම් කැබලි 28 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

3.5.2 පවරා නොගත් වත්කම්.

සභාවට අයත් රුඩ් 07 ක පමණ වූ ඉඩම් කැබලි 6 ක් හා භූමි ප්‍රමාණය නිශ්චිතව හඳුනාගෙන නොමැති ඉඩම් කැබලි 6 ක් සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

රුපියල් 327,326 ක් වියදමක් දරා ඉදිකරන ලද මාලිමබඩ සති පොළෙහි මාළු ලැලි 08 න් 2 ක කඩා වැටී තිබූ අතර එම කඩා වැටුනු වහල අදාල පාර්වයන් ලවා ඉදිකරවා ගැනීමට හෝ අලාභ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය.

4.1 අයවැය පාලනය.

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයන් 6 ක අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම අතර රු. 57,613,603 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය වූ අතර එම අගයන් සියයට 24 සිට සියයට 71 දක්වා වූ පරාසයන් පැවතුණි.

(ආ) එක් ආදායම් විෂයක පමණක් රු. 1,895 ක හිතකර විචලනයක් නිරීක්ෂණය වූ අතර එය සියයට 0.2 ක් වී තිබුණි.

(ඇ) වියදම් විෂයන් 8 ක අයවැයගත හා තථ්‍ය වියදම අතර රු. 62,736,289 ක හිතකර විචලනයක් නිරීක්ෂණය වූ අතර එම අගයන් සියයට 36 සිට 100 දක්වා පරාසයක පැවතුණි.

එම්.ජී. මදරසිංහ,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

එම්.ජී. මදරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
දකුණ විගණන කාර්යාලය
බත්තරමුල්ල

3.3 මානව සම්පත් කළමණාකරණය.

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත.

සේවක සංඛ්‍යා සැලැස්මේ අතිරික්තව පවතින තනතුරු 26 විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් 2018 සැප්තැම්බර් 10 දින කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ සෞඛ්‍ය කම්කරුවෙකු වෙත 2022 ජනවාරි 16 දින ටිපර් රථයේ රියදුරු ලෙස රාජකාරී පවරා තිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී රු. 396,817 ක් වැටුප් හා දීමනා ලෙස සභා අරමුදලින් වැය කර තිබූ බව විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) සේවක ණය.

සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ සේවය කර විශ්‍රාම ගොස් තිබූ රියදුරෙකුගෙන් අයවිය යුතු රු. 73,294 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව විසින් කටයුතු කර නොතිබුණු අතර එම නිලධාරියා විශ්‍රාම ගොස් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 3 කට අධික කාලයක් ගත වී තිබුණි.

(ඈ) සේවක ඇප

සභාවේ සේවය කර ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය කර තිබූ රු. 18,785 ක් වූ සේවක ඇප මුදල් නිලධාරීන් සභාවෙන් ස්ථානමාරුවී , සේවය හැර ගිය හා විශ්‍රාම ගිය වහාම නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවද ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකර සභාවේ රඳවා ගෙන තිබුණි.